

# අල්ලස් හෝ දූෂණ පිළිබඳ ගවේෂණාත්මක ජනමාධ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

## ඔබ...

**මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයක සේවය කරන උතුරු හෝ නැගෙනහිර පළාත්වල මාධ්‍යවේදියෙකුද?**

**අල්ලස් හෝ දූෂණ පිළිබඳ ගවේෂණාත්මක වාර්තාකරණයේ යෙදෙන අයෙක්ද?**

**තොරතුරු දැනගැනීමේ අයිතිය පදනම් කරගෙන අල්ලස් හෝ දූෂණ පිළිබඳ ගවේෂණාත්මක වාර්තාකරණයෙහි නියැලීම සඳහා අවශ්‍ය කුසලතා වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය දැනුම, පුහුණුව සහ අනුග්‍රහය ලබා දීමට අප සූදානම්**

## හැඳින්වීම

අල්ලස හෝ දූෂණයට එරෙහිව කටයුතු කිරීමේදී ශ්‍රී ලංකාව අත්පත් කරගැනීමට සමත් වී තිබෙන ප්‍රගතිය ප්‍රමාණවත් නැත. රජයේ සෑම මට්ටමකදී ම අල්ලස හෝ දූෂණය දුරලීම වසර 2030 තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අත්‍යවශ්‍ය ය.

අල්ලස හෝ දූෂණය පිටුදැකීමේදී ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට බිම් මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග එක්ව විශාල කාර්යභාරයක් සිදුකළ හැකි ය.

ගවේෂණාත්මක පුවත්පත් කලාව ඔස්සේ අල්ලස් හෝ දූෂණ විමර්ශනය කිරීම පිණිස පුවත්පත් කලාවේදීන් සතු කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කිරීමට නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සැලසුම් කර තිබේ.

මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ජනමාධ්‍යකරුවන් හට ජාතික හා ග්‍රාමීය මට්ටමේදී අල්ලස හෝ දූෂණය සිදු වන ආකාරය පිළිබඳ මනා අවබෝධයක්, තොරතුරු දැනගැනීමේ අයිතිය පාදක කරගෙන තොරතුරු වෙත ප්‍රවේශය සකස් කරගන්නා ආකාරය පිළිබඳ මනා දැනුමක් සහ ගවේෂණාත්මක පුවත්පත් කලාවේ නව තාක්ෂණයන් පිළිබඳ පුහුණුවක් අවශ්‍ය ය.

**මෙම මාධ්‍ය පුහුණුවෙහි ප්‍රධාන අරමුණ වන්නේ විද්‍යුත්, මුද්‍රිත සහ අන්තර්ජාල යන තුන් වර්ගයේ ම ජනමාධ්‍යවේදීන් අල්ලස හෝ දූෂණ පිළිබඳ වාර්තා කරන බව තහවුරු කිරීමයි.**

## අයදුම්කරු...

- උතුරු හා නැගෙනහිර පළාත්වල සේවය කරන ප්‍රාදේශීය ජනමාධ්‍යවේදියකු විය යුතු ය
- පූර්ණකාලීන හෝ නිදහස් මාධ්‍යවේදියකු විය යුතු ය
- අල්ලස හෝ දූෂණය පිළිබඳ වාර්තා කරන ජනමාධ්‍යවේදියකු විය යුතු ය
- උතුරු හෝ නැගෙනහිර පළාත්වල සිවිල් සමාජ සංවිධාන සමග සමීප සම්බන්ධතා ඇති අයෙකු විය යුතු ය

## මෙම පුහුණුවෙන් ඔබට ලැබෙන දේ

- අල්ලස හෝ දූෂණය පිළිබඳ හැඳින්වීමක්
- නූතන විමර්ශනාත්මක ජනමාධ්‍යවේදය පිළිබඳ හැඳින්වීමක්
- තොරතුරු දැනගැනීමේ හිමිකම් පනත භාවිතා කරන හැටි
- සිවිල් සමාජ සංවිධාන සමග එක්ව සමාජ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම
- ඔබ ගේ කථාව ගවේෂණය කිරීමට මූල්‍ය දිරි දීමනාවක්

අගෝස්තු 31 ට පෙර
fmmsrilanka@gmail.com විද්‍යුත් තැපෑලෙන්
අප හා සම්බන්ධ වන්න.

## මෙම වැඩ සටහන සම්බන්ධයෙන් පැවැත්වෙන වැඩමුලුවට සහභාගිවීමට කැමති නම් පහත දැක්වෙන තොරතුරු සහිත අයදුම්පතක් ඉදිරිපත් කරන්න.

## අයදුම්පත

1. සම්පූර්ණ නම:
2. ලිපිනය:
3. දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
4. උපන්දිනය
5. භාෂා මාධ්‍යය:
6. දුරකථන අංකය:
7. විද්‍යුත් තැපෑල:
8. සේවය කරන මාධ්‍ය ආයතනය:
9. එය කුමන වර්ගයේ මාධ්‍ය ආයතනයක්ද? මුද්‍රිත/විද්‍යුත්/අන්තර්ජාල
10. ඔබගේ වෘත්තියේ ස්වභාවය: පූර්ණ කාලීන/නිදහස් මාධ්‍යවේදී
11. අල්ලස හා දූෂණය පිළිබඳ වාර්තා කිරීමේ පළපුරුද්ද:
12. සිවිල් සමාජ සංවිධාන සමඟ කටයුතු කිරීමේ අත්දැකීම්:

011 236 8895 - කාර්යාලය
071 98 42 732 - ආදිල් අලි සබ්රි

FMM නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

EAST • WEST MANAGEMENT INSTITUTE

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
අංක 96, බර්නාඩ් සොයිසා මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.